ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

**ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධි වැඩසටහන- 3 වන මට්ටම 2022/2023 අවසාන පරීක්ෂණය**

**EPU3532 - විෂයමාලා අධ්‍යයනය සහ ප්‍රායෝගික වැඩ - භාෂා අධ්‍යයනය (සිංහල/දෙමළ/ඉංග්‍රීසි)**

**කාලය - පැය තුනයි. (03)**

---

**දිනය - 2024.02.10** **වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා**

---

**1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ තෝරා ගන්නා ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## 01-වන කොටස

01. මානව භාෂාවේ ලක්ෂණ තුනක් (03) කෙටියෙන් විස්තර කරන්න.

02. පෙර කියවීමේ කුසලතා අත්පත් කරගැනීමේ වැදගත්කම් තුනක් (03) ලියන්න.

03. භාෂාව ඉගැන්වීමේදී මාධ්‍ය ඵලදායී ලෙස භාවිතා කළ හැකි ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

04. සාර්ථක ගුරුවරයෙකුට සිසුන්ගේ භාෂා සංවර්ධනය සඳහා එළිමහන් පරිසරය අර්ථවත් ලෙස භාවිත කළ හැකි ආකාරය කරුණු තුනක් (03) යටතේ කෙටියෙන් පැහැදිලි කරන්න.

05. ප්‍රාථමික පන්ති කාමරයක සිටින සවන්දීමේ දුර්වලතා සහිත සිසුවෙකු තුළ හඳුනාගත හැකි ලක්ෂණ තුනක් (03) කෙටියෙන් විස්තර කරන්න.

06. සාර්ථක ඉගැන්වීමක් සඳහා ප්‍රාථමික පන්ති කාමරයේදී ඉගෙනුම් ආධාරක භාවිත කිරීමේ වාසි තුනක් (03) කෙටියෙන් පැහැදිලි කරන්න.

07. භාෂා සංවර්ධනය තුළින් සිසුන්ගේ නිර්මාණශීලීත්වය වැඩි දියුණු කළ හැකි ආකාරය උදාහරණයක් ඉදිරිපත් කරමින් කෙටියෙන් පැහැදිලි කරන්න.

08. "සන්නිවේදන නිපුණතා " පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## 02 කොටස

09. (i.) "කුඩා ළමුන්ගේ භාෂා කුසලතා සංවර්ධනය කිරීම සඳහා දෙමව්පියන් සහ පවුලේ සාමාජිකයන් විසින් පහසුකම් සැපයීම කළයුතු වේ." උදාහරණ සමඟ පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ii.) දෙමාපියන්, ඵලදායි ලෙස දරුවන්ට සවන්දීමේදී මුහුණ දෙන අභියෝග සාකච්ඡා කරන්න. මෙම අභියෝග ජය ගැනීමට උපාය මාර්ග යොජනා කරන්න. (ලකුණු 12)

10. (i.) ප්‍රාථමික විෂය මාලාවේ පදනම ලෙස අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතාවල වැදගත්කම සාකච්ඡා කරන්න. (ලකුණු 10)

(ii.) සිසුන් මෙම නිපුණතා සාක්ෂාත් කරගැනීම සහතික කිරීමේදී ගුරුවරුන්ගේ වගකීම පැහැදිලි කරන්න. (ලකුණු 10)

11. (i.) භාෂා ඉගෙනීම කෙරෙහි සමාජ අර්ථික පසුබිමේ බලපෑම විශ්ලේෂණය කරන්න. (ලකුණු 10)

(ii.) ප්‍රාථමික පාසල් අවධියේදී අවධානය නොකළ භාෂා අපහසුතා දරුවාගේ අධ්‍යයන කාර්ය සාධනය සහ සමාජ යහපැවැත්ම කෙරෙහි ඇති විය හැකි දිගුකාලීන බලපෑම සාකච්ඡා කරන්න. (ලකුණු 10)

12. (i.) ලිවීමේ කුලසලතා සඳහා අඩිතාලම දැමීමේදී පෙර ලිවීමේ ක්‍රියාකාරකම්වල කාර්යභාරය උදාහරණ සමඟ සාකච්ඡා කරන්න. (ලකුණු 10)

(ii.) මුල් ළමාවිය සිසුන් සඳහා පෙර ලිවීමේ ක්‍රියාකාරකම් දෙකක් (02) ලියන්න. ඔවුන්ගේ ලිවීමේ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා මෙම ක්‍රියාකාරකම් ඵලදායි ලෙස ක්‍රියාත්මක කළ හැකි ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 10)

13. (i.) ප්‍රාථමික පාසල් භාෂා නිපුණතා තක්සේරු කිරීමේදී සැබෑ (Authentic) තක්සේරු කිරීමේ ක්‍රම භාවිත කිරීමේ වැදගත්කම සාකච්ඡා කරන්න. (ලකුණු 10)

(ii.) පෙර පාසලේ සහ ප්‍රාථමික පාසලේ භාවිත කරන තක්සේරු කිරීමේ ක්‍රම සංසන්දනාත්මකව විමර්ශනය කරන්න. (ලකුණු 10)

සියළුම හිමිකම් ඇවිරිණි.